The Journal of Studies in Humanities
Volume 6 (II) 2020

Department of Humanities, Rajarata University of Sri Lanka

# සන්ධාර විශ්ලේෂණ ක්‍රමය (Content Analysis)

හඳගිරියේ සිරිසුමන හිමි

***Correspondence:***
sirisumana96@busl.ac.lk
sirisumanahandagiriye@gmail.com

***Specialty Section:***
Research

***Received:***
02 June 2021

***Revised:***
14 August 2022

***Accepted:***
16 August 2022

***Published:***
02 January 2023

***Citation:***
සිරිසුමන, හඳගිරියේ. (2020). *සන්ධාර විශ්ලේෂණ ක්‍රමය (Content Analysis) මානවශාස්ත්‍ර අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය.* 6(11), 103-114.
ISSN (Online): 2961-564X
ISSN (Print) : 2362 - 0706

## Abstract

Content analysis has been defined as a systematic, reproducible method of compressing many words of text into fewer content categories based on explicit encoding rules (Berelson, 1952; GAO, 1996; Krippendorff, 1980; and Weber, 1990). Holsty (1969) defined content analysis as: "Any way of drawing conclusions by objectively and systematically identifying certain characteristics of messages." Content analysis is an exploratory technique used to identify patterns in recorded communication. To conduct content analysis, you systematically collect data from a set of texts that can be written, spoken or visual: books, newspapers and magazines, speeches and interviews, web content and social media posts, photographs and films. Content analysis differs from other studies in that it does not collect data directly from people. Instead, it is the study of data that is already recorded in social networks, texts, books, or any other

physical or virtual form. In this article, I will explain what content analysis is and how to apply content analysis in educational research.

***keywords:*** content analysis, education, quantitative reserach, reseach

## හැඳින්වීම

පර්යේෂණයක් යනු යමක් පිළිබඳ ව විධිමත් ක්‍රමයක් මගින් සොයාගත් පිළිගත හැකි නව දැනුම් සම්භාරයකි. සහේතුකව ඔප්පු කළ නොහැකි උපකල්පන හා පිළිගැනීම්, මතවාද, සැකමුසු අදහස් වෙනුවට සාක්ෂි සහිතව තර්කානුකූලව සවිස්තරාත්මකව ඔප්පු කළ හැකි අභිනවයෙන් සොයාගත් නව මතයක් ලෙස 'පර්යේෂණය' යන්න හැඳින්විය හැකි ය. පර්යේෂණ පිළිබඳ ඩ්‍රිව්ගේ අදහස වනුයේ දැනට කිසියම් මතභේදයකට තුඩුදුන් ගැටලුවක් විසදා ගැනීමට අවශ්‍ය නව දැනුම විධිමත් ව සොයා බැලීමට ගන්නා පියවරක් බවයි (Drew, 1980). ඩ්‍රිව්ගේ නිර්වචනය අනුව පර්යේෂණයක් යනු කුමක් ද? එහි අරමුණ හා අවශ්‍යතාව කෙබඳු ද? යන කරුණු ගම්‍ය වේ. අධ්‍යාපන සංසිද්ධියක් අවබෝධ කර ගැනීමට, පැහැදිලි කිරීමට, පුරෝකථන හෝ පාලනය කිරීමකට හෝ එබඳු සංදර්භයකට අයත් පුද්ගලයින් බලගතුකරණයකට යොදාගත හැකි දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා අර්ථකථනය කිරීම යන පියවර ඇතුළත් ක්‍රමානුකූල විමසුම් ක්‍රියාවලියක් පර්යේෂණය බව මෙටන්ස්ගේ අදහසයි (Metens,1998;02). එසේ ම යම් මාතෘකාවක් හෝ කාරණයක් පිළිබඳව අවබෝධය වර්ධනය කරගැනීම සඳහා දත්ත එකතු කිරීම හා ඒවා විග්‍රහ කිරීමේ පියවර පර්යේෂණයකින් සිදු වන බව ක්‍රෙස්වෙල්ගේ අදහසයි (Creswell, 2008). අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලුවක් ලෙස පවතින යම් සංසිද්ධියක් පදනම් කොට ගනිමින්, ගැටලුවට සැබෑ ලෙස පාදක වන දත්ත රැස්කරමින්, එම දත්ත විශ්ලේෂණය කරමින්, අර්ථකථනය කරමින් විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ සහේතුක කරුණු පැහැදිලි කර ගැනීමකින් පිළිගත හැකි විසඳුමකට එළඹීම අධ්‍යාපන පර්යේෂණයක් වේ. මේ අනුව පර්යේෂණයක් වලංගුතාව හා විශ්වසනීයතාව ආරක්ෂා කර ගනිමින් සිදු කිරීම සඳහා පර්යේෂණ විද්‍යාත්මක පදනමක පිහිටිය යුතු ය. ඒ සඳහා පර්යේෂණ ක්‍රියාවලියකදී විවිධ පර්යේෂණ ක්‍රම අනුගමනය කළ හැකි ය. ඒ අනුව පර්යේෂණ ක්ෂේත්‍රයේ ආධුනිකයන්ට කෙරෙන මග පෙන්වීමක් වශයෙන් පර්යේෂණ ක්‍රම අතරින් සන්ධාර විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙම ලිපියෙහි අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රම හා සන්ධාර විශ්ලේෂණය

පර්යේෂණවල දී ලබා ගනු ලබන දත්තවල ස්වභාවය අනුව ගුණාත්මක පර්යේෂණ ක්‍රම (qualitative research), ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම (quantitative research) හා මිශ්‍ර පර්යේෂණ ක්‍රම (mixed methods research) වශයෙන් පර්යේෂණ තෙවදෑරුම් ය.

ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිතයෙන් සන්ධාර විශ්ලේෂණ පර්යේෂණ සිදු කළ හැකි ය. ගුණාත්මක පර්යේෂණ යනු රැස්කරනු ලබන සංඛ්‍යාත්මක නොවන දත්ත නිරීක්ෂණය කිරීමේ විද්‍යාත්මක ක්‍රමයකි. ගුණාත්මක පර්යේෂණ විවෘතාන්තික සහ සංවාදාත්මක සංන්නිවේදනය මගින් දත්ත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙන වෙළඳපොළ පර්යේෂණ ක්‍රමයක් වශයෙන් ද නිර්වනය කෙරේ. මෙම ක්‍රමයේ දී මිනිසුන් සිතන්නේ 'කුමක් ද?' යන්න ගැන පමණක් නොව එසේ සිතන්නේ 'ඇයි?' යන්න ගැන විමසා බලනු ලැබේ. ගුණාත්මක පර්යේෂණ සඳහා අදාළ කර ගනු ලබන්නේ අර්ථ, සංකල්ප, නිර්වචන, ගතිගුණ, රූපක, සංකේත සහ දේවල් පිළිබඳ විග්‍රහයන් ආදියයි. කිසියම් ප්‍රපංචයක් සිදු වන්නේ ඇයි සහ කෙසේ ද යන්නට පිළිතුරක් දීමට ගුණාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කිරීම වැදගත් වේ. එහෙත් මෙහි දී ප්‍රපංචයේ සිදුවීම් වාර ගණන පිළිබඳ අවධානයට යොමු නොකෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රම බහුල වශයෙන් අධ්‍යාපනික ශික්ෂණයන්හිදී ද භාවිත කරනු ලැබේ. විශේෂයෙන් සමාජ සංකල්ප සහ සමාජීය විද්‍යාවන් සම්බන්ධව පර්යේෂණ ක්‍රමය ලෙස මෙය යොදා ගැනේ. මීට අමතර ව අධ්‍යාපනික වශයෙන් අගයක් නොමැති වෙළඳපළ සමීක්ෂණ, ව්‍යාපාර, ජනමාධ්‍ය සහ සේවා ක්ෂේත්‍රවල දී ද ගුණාත්මක පර්යේෂණ ක්‍රම භාවිත කරනු ලැබේ.

මෙම පර්යේෂණ ක්‍රමය බොහෝවිට පුද්ගලයින් කීපදෙනෙකු හෝ කණ්ඩායමක් යම්කිසි සාමාජික හෝ මානව ගැටලුවක් උදෙසා දෙන අර්ථකථනය අවබෝධ කර ගැනීම හෝ ගවේෂණය කරන අන්දම හඳුනා ගැනීම සඳහා යොදා ගැනේ. මෙම පර්යේෂණ ක්‍රියාවලිය යටතේ බොහෝ විට සිදුවනුයේ මතුවන ප්‍රශ්න හා පිළිවෙත් සෙවීම, සහභාගීවන්නන්ගේ වටපිටාවේදීම දත්ත රැස් කිරීම, දත්ත විග්‍රහයේදී විශේෂිත අදහස් ඔස්සේ පොදු තේමාවන්ට ළගාවීම හා දත්තවලින් නිරූපණය වන තත්ත්වය පිළිබඳ අර්ථකථනය කිරීමයි. එසේ ම මෙහි අවසාන පර්යේෂණ වර්තාව නම්‍යශීලි ව්‍යුහයක් ගනු ලැබේ. මෙම ක්‍රමය යටතේ පර්යේෂණ ක්‍රියාවලියේ නියැළෙන්නන් පර්යේෂණ ක්‍රියාවලිය උද්ගාමී (Inductive) රටාවකට යොමු කරන අතර පුද්ගල අර්ථකථනයට වැඩි අවධානයක් යොමු කරමින් යම්කිසි සිද්ධියක සංකීර්ණත්වය හඳුනා ගැනීමට වැඩි නැඹුරුවක් දක්වනු ලැබේ. ගුණාත්මක පර්යේෂණවල දැකිය හැකි මූලික ලක්ෂණ 3 කි.

1. සෑම මනුෂ්‍යයෙක් ම එදිනෙදා ජීවිතය ආශ්‍රිතව සෑම අත්දැකීමක් මෙන් ම සෑම විශේෂිත සිද්ධියක්ම අර්ථවත් සිදුවීම් වශයෙන් සලකයි. සංස්කෘතිකමය නිර්මිත මෙන් ම ඔවුන්ටම අවේණික වූ හැගීම් හා සිතුවිලි මගින් සෑම මනුෂ්‍යයෙක් ම තමාට පොදු වූ අනන්‍යතාවක් ගොඩනගා ගන්නා අතර එම තත්ත්වය අනුව සමාජයේ සෙස්සන් සමඟ අන්තර්ක්‍රියාවලියකට යොමු වේ. ඒ අනුව මින් අදහස් වනුයේ ඕනෑම ක්‍රියාවකට අර්ථකථනයක් වැදගත් වන බවයි. මේ අනුව පැහැදිලි වනුයේ ගුණාත්මක පර්යේෂකයාට වැදගත් වන්නේ විචල්‍ය අතර ඇති අන්තර්ක්‍රියාකරණය බවයි.

2. සෑම අර්ථවත් සිද්ධියක් ම අධ්‍යයනය කිරිමේදි හැකි තරම් දුරට එය කළ යුත්තේ ස්වභාවික සන්දර්භය තුළ ය. මැලිනොවුස්කිට (Malinowski,1992:25) අනුව සෑම පර්යේෂණයක් ම තමා අධ්‍යයනයට පාත්‍ර කරන සිද්ධිය/පුද්ගලයා/ප්‍රපංචය ආශ්‍රිත යථාර්ථය අවබෝධ කර ගැනිමට නම් එම අධ්‍යයනයට පාත්‍ර වන දෙය අදාළ සංස්කෘතිය තුළ ම කළ යුතු ය. ගුණාත්මක පර්යේෂණයකදී පර්යේෂකයෝ පර්යේෂණය ක්‍රියාත්මක කරන සංස්කෘතික පසුබිම එම පරිසරයේ ජීවත් වන ප්‍රජාවත්, තොරතුරු සපයන්නන්, පර්යේෂණය සිදුවන ප්‍රදේශය, කාල පරිච්ඡේදයේ දී අනිවාර්යයෙන් ම අවධානය යොමු කරති. ගුණාත්මක පර්යේෂණ ස්වාභාවික පරිසරයක දියත් කරන හෙයින් පර්යේෂකයාට අවශ්‍ය පරිදි පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ නිදහස පවතී.

03. පර්යේෂණ ක්‍රමයේ තෙවන ලක්ෂණය වන්නේ පර්යේෂකයාගේ භූමිකාව ය. මෙහි දී ප්‍රබල ලෙස ඉස්මතු කරන කරුණ වන්නේ පර්යේෂකයාගේ භූමිකාවයි. පර්යේෂකයා අර්ථ නිරූපණය කරන වේදකයකු (Interpretive subject) වේ. මෙම කරුණ ඉතා වැදගත් වන්නේ සම්පූර්ණ පර්යේෂණයෙහිම ප්‍රාථමික උපකරණය පර්යේෂකයා වන හෙයිනි. ඊට හේතුව ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ පර්යේෂණ පරිසරය තුළ සිදුවන සෑම ක්‍රියාවකට ම අර්ථකථනයක් ලබාදෙන්නේ පර්යේෂකයා විසිනි.

ස්වාභාවික පරිසරයකදී දියත් කරන මෙම පර්යේෂණ ක්‍රමය මගින් පරිසරයක පුද්ගලයින් ගොඩනගන බහුවිධ යථාර්ථ (Multiple realitieg) හඳුනාගැනීමට හැකි ය. එමෙන් ම පර්යේෂණයට පාත්‍රවන්නන් සමඟ අන්තර් සබඳතා ගොඩනගා ගැනීම නිසා පර්යේෂකයා ද පර්යේෂණ අධ්‍යයනයේ කොටස්කරුවෙකු බවට පත් වේ. මේ හේතුව නිසා ම පර්යේෂණයට භාජනය වන්නන්ගේ සංජානනය හෝ ප්‍රතිපක්ෂය හඳුනා ගැනීමට පර්යේෂකයාට හැකියාව ඇත. පර්යේෂණයට භාජනය වන අයගේ ප්‍රතිපක්ෂය යනුවෙන් අදහස් කරනුයේ ඔවුන්ගේ අගයන් හා ඔවුන් යම් යම් දේ පිළිබද දරණ අදහස් හා හැඟීම් ය. ඒ අතරම මෙහි දී වැදගත් වන තවත් කරුණක් වන්නේ මෙම පර්යේෂණ ක්‍රමය යටතේ ලබා ගන්නා අනාවරණ අනෙකුත් සංදර්භයන්ට සාමාන්‍යකරණය කිරීම අපහසුවීම යි. ඒ අනුව ගුණාත්මක පර්යේෂණ වලංගු වනුයේ අධ්‍යයන සංදර්භයට පමණි.

ගුණාත්මක පර්යේෂණ සඳහා පර්යේෂකයාට දත්ත ලබා ගැනීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිත කෙරේ. ඒ සඳහා අර්ථ, නිර්වචන, ගතිගුණ හා සංකල්ප වැනි ගුණාත්මක දත්ත භාවිත කළ හැකි ය. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරන ආකාර කිහිපයකි. එනම්,

මාතෘකා විශ්ලේෂණය (content analysis)

කථා විශ්ලේෂණය (narrative analysis)

දේශනා විශ්ලේෂණය (discourse analysis)

සැකිලි විශ්ලේෂණය (framework analysis)
පදනම් න්‍යාය (grounded theory)

(ලලිතධීර, 2018 ඃ321)

මෙම විශ්ලේෂණ ක්‍රම ඇතැම් විට පර්යේෂණ ක්‍රම වශයෙන් ද ක්ෂේත්‍රයේ භාවිත වේ. කෙසේ වුව ද ඉහත විශ්ලේෂණ ක්‍රම අතරින් යෝග්‍යතම විශ්ලේෂණ ක්‍රමය හඳුනාගැනීම සඳහා එම ක්‍රම පිළිබඳ කෙටියෙන් පහත විග්‍රහ කෙරේ. ඒ අනුව පළමු විශ්ලේෂණ ක්‍රමය වනුයේ මාතෘකා විශ්ලේෂණය යි. මෙය ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරන ප්‍රධාන ක්‍රමයකි. මෙහි දී දත්ත කේත කිරීම, සාරාංශ කිරීම හා වර්ග කිරීමට හැකිවන ලෙස වෙන්කර ගැනීම සිදු වේ. එසේ ම මෙය දත්ත අර්ථ දැක්වීමේ මට්ටම හා විස්තරාත්මක මට්ටම වශයෙන් ප්‍රධාන මට්ටම් දෙකකි. කතා විශ්ලේෂණය මගින් සිදුවනුයේ සාමාන්‍යයෙන් සම්මුඛ සාකච්ඡාවක මෙන් ම නිරීක්ෂණයකම පවතින දීර්ඝ කතා ස්වරූපය පර්යේෂකයාගේ මැදිහත්වීමෙන් විස්තර කිරීම් කෙටි කර දැක්වීම, වඩාත් බර කොට දැක්වීම නැතහොත් පාඨකයාට වැදගත් වන ආකාරයට ඉදිරිපත් කිරීම යි. මෙහිදී ප්‍රධාන කාර්යය වනුයේ විවිධ පුද්ගලයන් විවිධ ආකාර ලෙස ලබාදෙන තොරතුරු කිසියම් විධිමත් ආකාරයකට ගොනු කර නැවත ඉදිරිපත් කිරීමකි. දේශනා විශ්ලේෂණ යනු පුද්ගලයින් භාවිත කරන භාෂාව විශ්ලේෂණය හා අධ්‍යයනය කිරීමයි. මෙය පුද්ගලයින් කතා කරන දේ ලියන දෑ සම්බන්ධව ඍජුව හා වක්‍රව සන්නිවේදනය වන අදහස් විශ්ලේෂණය කිරීමේ ක්‍රමය ලෙස ද හැඳින් වේ. සැකිලි විශ්ලේෂණයේදී පියවර කිහිපයකි. පළමු පියවර දත්ත පරිශීලනය කරමින් හුරුපුරුදු බවට පත් කර ගැනීමයි. දෙවන පියවර නම් තේමා සහිත රාමුවක් හඳුනාගැනීම, දත්ත සඳහා කේත යෙදීම හා කටුසටහන් ඇඳීමත් අනතුරුව සබඳතා හඳුනාගැනීම සහ අර්ථකථන සිදු කිරීම මෙහිදී සිදු වේ. පදනම් න්‍යාය ගුණාත්මක පර්යේෂණ ක්‍රමය තුළ උද්ගාමී ලෙස න්‍යාය ගොඩ නැගීම සඳහා භාවිත වන ක්‍රමය ලෙස හැඳින්විය හැකි ය (ලලිතධීර, 2018 ඃ321-322).

## මාතෘකා විශ්ලේෂණය/අන්තර්ගතය විශ්ලේෂණය හෙවත් සන්ධාර විශ්ලේෂණය (content analysis)

සන්ධාර විශ්ලේෂණ ක්‍රමය දත්ත විශ්ලේෂණ ක්‍රමයක් මෙන් ම පර්යේෂණ ක්‍රමයක් වශයෙන් ද භාවිත වේ. ඒ අනුව එහි භාවිතාව හඳුනා ගැනීම පර්යේෂකයන්ට වැදගත් හෙයින් පහත අයුරින් එය විමසා බැලේ. සන්නිවේදන අධ්‍යයනය සඳහා මුල්කාලීනව භාවිත කළ අතර නූතනය වන විට එය ගුණාත්මක තොරතුරු රැස්කර ගැනීමේ අරමුණ සහිතව ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා යොදාගන්නා විශ්ලේෂණ ක්‍රමයකි. මෙම ක්‍රමය අර්ථ විශ්ලේෂණය (Meaning analysis), වගන්ති විශ්ලේෂණය (Statement analysis), ක්‍රමානුකූල සන්ධාර විශ්ලේෂණය (Systematic content analysis) හා ගුණාත්මක සන්ධාර විශ්ලේෂණය (Qualitative content analysis) යන නාමයන්ගෙන් හැඳින්වේ. මෙම ක්‍රමය වාර්තා අධ්‍යයන (Document Study) ක්‍රමය හා සමාන වේ.

පරිගණක මගින් හා සංඛ්‍යාන විද්‍යාත්මක ඉගැන්වීම් මගින් විශ්ලේෂණය කළ හැකි විධිමත් උපන්‍යාස භාවිතය විශාල වශයෙන් විද්‍යාත්මක නියැදි හා ප්‍රමාණාත්මක දත්ත භාවිතය සඳහා සන්ධාර විශ්ලේෂණය උපකාරි වේ. මෙම ක්‍රම ශිල්පයේ අරමුණු වන්නේ විවිධ සමීක්ෂණ උපක්‍රම මගින් ආවරණය කරනු ලබන සුවිශේෂී සියලු ක්ෂේත්‍ර අධ්‍යයනයට ලක් කිරීමයි. ඊට අමතරව එම ක්‍රමයටම විශේෂිත අරමුණු ද වේ. එනම් කර්තෘත්වය පිළිබඳ ප්‍රශ්න කිරීමට ලක්ව ඇති වාර්තාවන්හි කර්තෘත්වය තීරණය කිරීම ඉන් එකකි. ලිඛිත හෝ වාචික වාර්තාවක අන්තර්ගතය ක්‍රමානුකූලව විස්තර කරන ශිල්පීය ක්‍රමයක් වශයෙන් සෝමර් හා සෝමර් ප්‍රකාශ කරයි (1980: 112). එසේ ම පෙළෙහි අන්තර්ගත සුවිශේෂී ගුණාංග ක්‍රමානුකූලව හා වාස්තවිකව හැඳින ගැනීම මගින් කරුණු අධ්‍යයනය කිරීමේ පර්යේෂණ ක්‍රමයක් බව ස්ටෝන් (1966:05) විග්‍රහ කරයි. විද්‍යාත්මක උපන්‍යාසය පරීක්ෂා කිරීම හැරුණු විට සන්ධාර විශ්ලේෂණයේ අරමුණු හතක් හෝල්ස්ටි (1969 : 43) දක්වයි.

1. සන්නිවේදන අන්තර්ගතයේ ප්‍රවනතා විස්තර කිරීම
2. ඉදිරිපත් කරනු ලබන පණිවිඩය හා හැඳිනගත් ගුණාංග පිළිබඳ මූලාශ්‍ර ප්‍රකාශ කිරීම
3. ප්‍රමිතීන්ට එරෙහි සන්නිවේදනයේ අන්තර්ගතය ගණනය කිරීම
4. ඒත්තුගැන්වීමේ ක්‍රම විශ්ලේෂණය කිරීම
5. ශෛලිය විශ්ලේෂණය කිරීම
6. ප්‍රේක්ෂකයන් සඳහා නිෂ්පාදිත පණිවිඩවලට ඔවුන්ගේ දන්නා ගුණාංග ප්‍රකාශ කිරීම
7. සන්නිවේදන රටා විස්තර කිරීම


මේ අනුව වාර්තා කරන ලද සංසිද්ධීන් විද්‍යාත්මක ක්‍රමයට අනුව සැලකිය හැකි දත්ත බවට පත් කිරීම මගින් දැනුම පිළිබඳ ක්‍රමයක් ගොඩනැගිම මෙයින් සිදු වෙයි. සන්ධාර විශ්ලේෂණයේ දී භාවිතයට ගැනෙන උපක්‍රම තුනකි. ප්‍රථමයෙන් හා මූලික වශයෙන් කළයුතු වැදගත්ම දෙය වන්නේ අධ්‍යයනය කිරීමට ඇති ක්ෂේත්‍රය හැඳිනගැනීම යි. දෙවැනි පියවර වන්නේ තමා තෝරාගත් පර්යේෂණ ක්ෂේත්‍රය වර්ගවලට බෙදා ගැනීමයි. මෙය සන්ධාර විශ්ලේෂණයේ වැදගත්ම පියවරයි. තෙවැනි පියවර වන්නේ වර්ගීකරණය නිශ්චිතව කළ පසු විශ්ලේෂණය කළ යුතු ඒකක තීරණය කිරීමයි (කර්ලින්ගර්: 1986).

මෙම පර්යේෂණ ක්‍රමයේ දී ද කිසියම් සංසිද්ධියක් පර්යේෂණාත්මකව විශ්ලේෂණය කිරීම සිදු වේ. පර්යේෂණය බහුලව සිදුවනුයේ සන්නිවේදන ක්ෂේත්‍රය ආශ්‍රිතවයි. එහි දි ප්‍රවෘත්ති සඟරා හෝ පත්‍රිකා ආදිය ආශ්‍රිතව සිදු කෙරේ. මෙම ක්‍රමය භාවිතයට ගන්නාවිට වචන ගණන් කිරීම මඟින් තේමාවක් අන්තර්ගත විශ්ලේෂණය සිදු කළ හැකි ය. උදාහරණයක් ලෙස මාස කිහිපයක් පුවත්පත් කිහිපයක් ඇසුරින් දේශපාලන ප්‍රචණ්ඩත්වය හා අදාළ වචන භාවිත වී ඇති අයුරු අධ්‍යයනය කොට දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිගමනයකට බැසගත

ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706

හැකි ය. වචන ගණනය කර සංකල්ප ගොඩනගා ගැනීම ද මෙම පර්යේෂණ ක්‍රමය මඟින් සිදුකළ හැකි ය. උදාහරණයක් ලෙස අපරාධ, බාලාපරාධ, සොරකම් හා මංකොල්ලකෑම් යන වචන තුළින් අපගාමීත්වයක් අනාවරණය වේ. එම වචන ඒකරාශි කිරීමෙන් අපගාමී සංකල්පයක් ඇති බව විශ්ලේෂණය කළ හැකිය (හෙට්ටිආරච්චි, 2002 : 100).

මේ පිළිබඳ අවධානයට ලක් කළ බෙරිල්සන් සන්ධාර විශ්ලේෂණය යනු සන්නිවේදනයේ පැහැදිලිව සඳහන් සන්ධාරය වාස්තවිකව ද, ක්‍රමානුකූලව ද, ප්‍රමාණාත්මකව ද, විස්තර කිරීමට යොදාගෙන ඇති ශිල්පීය ක්‍රමයක් බව හඳුන්වයි (1952: 18). සන්ධාර විශ්ලේෂණය යනු හුවමාරු කරගන්නා සන්නිවේදනයේ ලැබෙන සාධක අනුව හේතුන් හා ලබා ගන්නා නිගමන අධ්‍යයනය කිරීම බව ඔස්ගුඩ්ගේ අදහසයි (1959 :36). දත්ත සමූහයක් සංසන්දනයට, වෙනස්කම් දැකීමට හා ප්‍රවර්ගකරණයට සම්බන්ධ විවිධ ලිඛිත විශ්ලේෂණ ගණනාවක් සඳහා යොදා ගන්නා වූ පොදු පදයක් ලෙස සන්ධාර විශ්ලේෂණය හඳුන්වයි (Schwandt, 1997).




සන්ධාර විශ්ලේෂණ ක්‍රියාවලිය (Bos & Tanai, 1999: 667)

සන්ධාර විශ්ලේෂණයේ අත්‍යවශ්‍ය ලක්ෂණයක් ලෙස විවිධ න්‍යායාත්මක ආකෘති පදනම් කොටගෙන ගොඩනගා ගන්නා ලද ප්‍රවර්ග භාවිත කිරීම හඳුන්වා දී ඇති අතර එම ප්‍රවර්ග බොහෝවිට පර්යේෂකයා විසින් රැස් කර ගන්නා දත්ත මත සංවර්ධනය කරගන්නා ඒවා නොවන බව පැහැදිලි ය. එහෙත් රැස් කරගන්නා දත්ත තොරතුරු අනුසාරයෙන් එම ප්‍රවර්ග නිරතුරුවම ඇගයීමට ලක්වන අතර අවශ්‍ය පරිදි සංස්කරණය කර ගැනීමටද හැකි ය. ප්‍රවර්ග භාවිතය නිසා පර්යේෂණයක දී විස්තරාත්මක ලෙස රැස්කර ගන්නා දත්ත සාරාංශ ගත කෙරේ. එසේ සාරාංශ කිරීමේ දී සන්ධාර විශ්ලේෂණය සමාජ යථාර්ථය පිළිබඳ සැලකිලිමත් වන බැවින් විශ්ලේෂණ ප්‍රතිඵල හා ඒවායේ අර්ථ කථන එකිනෙකට පරායත්ත වන බවද (Bos & Tanai, 1999: 666) පෙන්වා දේ. මේ අනුව බැලීමේ දී සන්ධාර විශ්ලේෂණය බොහෝවිට න්‍යායාත්මක පදනම ඇති ප්‍රවර්ග භාවිත කරමින් සමාජ යථාර්ථයට සමීප වූ විශ්ලේෂණ හා අර්ථකථන තුළින් යම් සංසිද්ධීන් පිළිබඳ සාමාන්‍යකරණයට එළැඹීමට උදව්වන විශ්ලේෂණ ක්‍රම ශිල්පයක් බව පැහැදිලි වේ. සන්ධාර විශ්ලේෂණ ක්‍රියාවලියක අනුගමනය කළ යුතු පියවර කිහිපයකි.

යථෝක්ත සන්ධාර විශ්ලේෂණ ක්‍රියාවලියට අනුව පර්යේෂණය ආරම්භ වන්නේ පර්යේෂණ ගැටලුව පදනම් කරගනිමින් පර්යේෂකයා විසින් ගොඩනගා ගන්නා න්‍යායාත්මක විමර්ශනයකිනි. එයින් පර්යේෂකයා විසින් මතු කර ගන්නා ගැටලුව ආශ්‍රිතව ගොඩනගා ගන්නා ලද පර්යේෂණ රාමුව පර්යේෂණ ප්‍රශ්න හා උපකල්පිත පදනම් කරගනිමින් ප්‍රවර්ග පිහිටුවා ගැනීමත්, එයින් වලංගු දත්ත රැස්කිරීමත්, අනතුරුව එම දත්ත විශ්ලේෂණය කරමින් ගැටලුවට හා අරමුණුවලට අනුකූලව දත්ත අර්ථකථනයත් සිදු කෙරේ. මෙය නිගාමී චින්තන ක්‍රියාවලිය ඇසුරින් ප්‍රවර්ග කිරීමක් වන හෙයින් උද්ගාමී ක්‍රමයෙන් ද සන්ධාර විශ්ලේෂණය සිදු විය හැකි බව Mayring (2000, 11) හඳුන්වාදී ඇත. සන්ධාර විශ්ලේෂණය පිළිබඳ පුළුල් විග්‍රහයක යෙදෙන මේරින් (Mayring) පර්යේෂකයෙක් රැස්කරගත් දත්ත විශ්ලේෂණයේ දී අනුගමනය කළ හැකි සුවිශේෂ ක්‍රියාමාර්ග හතක් නිදසුන් සහිතව විග්‍රහ කර ඇත. එහි සය වැනි ක්‍රියාමාර්ගය වනුයේ විශ්ලේෂණ ක්‍රියා මාර්ග සුවිශේෂී ලෙස හඳුනා ගැනීම හා අර්ථ දැක්වීම යන්නයි. ඒ සඳහා ඔහු ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමශිල්ප තුනක් හඳුන්වා දී ඇත.

01. සාරාංශ කිරීමේ සන්ධාර විශ්ලේෂණය (Summarizing)
02. විස්තරාත්මක සන්ධාර විශ්ලේෂණය (Explicative)
03. ව්‍යුහගත කිරීමේ සන්ධාර විශ්ලේෂණය (Structuring)

සාරාංශ කිරීමේ සන්ධාර විශ්ලේෂණයේ දී පර්යේෂණ අරමුණු හා සුවිශේෂ පර්යේෂණ ප්‍රශ්න කල්පිතවලට එතරම් අදාළ නොවන සහ එකම අර්ථයක් ගෙන දෙන තොරතුරු හෝ වාක්‍ය ඛණ්ඩ ඉවත් කරනු ලැබේ. එසේ ම එකිනෙකට අන්තර් සම්බන්ධතාවක් ඇති

අදහස් ගැළපීමෙන් අදහස් ගොනුකරමින් සාරාංශගත කිරීම මෙහිදී සිදු වේ. පර්යේෂකයාගේ වියුක්ත චින්තනයේ ස්වභාවය මත සාරාංශගත තොරතුරු සමාජ යථාර්ථයට සමීප විය හැකි ය. එසේ ම පර්යේෂණය පිළිබඳ සාමාන්‍යකරණයට එළැඹීමට ද එමගින් පර්යේෂකයාට පහසුවක් සැලැසේ. තොරතුරු සම්පිණ්ඩනය කිරීම දත්තවල අර්ථය විකෘති නොවන අන්දමට අර්ථවත්ව සිදුකිරීමට පර්යේෂකයා සංකීර්ණ කුසලතාවලින් යුක්ත විය යුතු ය.

විස්තරාත්මක සන්ධාර විශ්ලේෂණය සාරාංශ කිරීමේ සන්ධාර විශ්ලේෂණයට හාත්පසින්ම වෙනස් ය. මෙයින් දුරවබෝධයන්, උභයාර්ථයන් හා එකිනෙකට වෙනස් අදහස් මතු කරන යෙදුම් වඩාත් හොඳින් පැහැදිලි කිරීම් මෙහිදී සිදු වේ. පිළිගත් මූලාශ්‍ර ඇසුරෙන් හඳුනාගත් අර්ථකථන කෙරෙහි විශ්වාසයකින් කටයුතු කිරීම ද මෙහි දී අනුගමනය කරන ක්‍රියා මාර්ග යකි. මෙම ක්‍රමය පිළිබඳව විමසා බැලීමේදි තවදුරටත් රැස්කරගන්නා තොරතුරු පැහැදිලි කිරීම සඳහා වෙනත් තැන්වලින් වගන්ති ගළපාගැනීම නැතහොත් රැස්කරගන්නා ලද තොරතුරුවලින් ඔබ්බට තොරතුරු සොයා බැලීම ද සිදු කළ හැකි බව සඳහන් වේ.

ව්‍යුහගත කිරීමේ සන්ධාර විශ්ලේෂණයේ දී රැස්කරගන්නා ලද තොරතුරුවල ව්‍යුහ හඳුනාගැනීමට උත්සාහ දරනු ලැබේ. මෙම ව්‍යුහගත කිරීම ආකාර කීපයකින් සිදු කළ හැකි ය.

- විධිමත් ව්‍යුහගත කිරීම (දත්තවල පැහැදිලිව මතුවී නොපෙනෙන ව්‍යුහ අනාවරණය කරගැනීම)
- විෂයානුගත ව්‍යුහගත කිරීම (තොරතුරු අවශ්‍ය පරිදි තෝරමින් වැදගත් විය හැකි විෂයන්හි සමහර ක්ෂේත්‍රවලට පමණක් ගොනු කළ හැකි ය.)
- පැහැදිලි කිරීමේ ව්‍යුහගත කිරීම (රැස්කරගන්නා ලද තොරතුරු වල අන්තර්ගත සුවිශේෂී ලක්ෂණ වැඩිදුරටත් පැහැදිලි වන ආකාරයට ව්‍යුහගත කිරීම)
- පරිමාණිත ව්‍යුහගත කිරීම (පර්යේෂකයා විසින් රැස්කරගත් තොරතුරුවල සමහර කොටස් පරිමාණයකට අනුව තරාගත කිරීම)

මෙම විවරණය අනුව සන්ධාර විශ්ලේෂණය විසිවන ශතවර්ෂයේ මුල් භාගයේ සිට පර්යේෂකයන්ගේ අවධානයට ලක් වූ පර්යේෂණ ක්‍රමයක් බවත්, එය සමාජීයවිද්‍යා පර්යේෂණ විෂයයෙහි ද බහුලව භාවිතයට ගන්නා බවත් පැහැදිලි වේ. ඒ අනුව සන්ධාර විශ්ලේෂණ ක්‍රමයෙන් පර්යේෂකයන්ට ලබාගත හැකි ප්‍රයෝජන රැසකි. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය මිශ්‍ර කොට භාවිත කළ හැකිවීම, විශේෂයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණවල වලංගුතාව හා විශ්වසනීයතාව තහවුරු කිරීම සඳහා යොදාගත හැකි වීම මෙහි ප්‍රයෝජන වේ. මෙම ක්‍රියාවලිය මගින් රැස්කරගන්නා ලිඛිත තොරතුරු ඇසුරෙන් තොරතුරු සන්නිවේදනය පිළිබඳ සලකා බැලෙන අතර එය සමාජ

අන්තර් ක්‍රියාකාරීත්වයෙහි ඉතා වැදගත් අංශයකි. එසේ ම සන්ධාර විශ්ලේෂණය සමාජ යථාර්ථයට සමීප තොරතුරු හෙළි කිරීමේ ක්‍රියාමාර්ගයක් වන බැවින් එමගින් ඉතාමත් වටිනා සංස්කෘතිකමය සහ ඓතිහාසික තොරතුරු සම්බන්ධ අන්තර් ඥානයක් ලබා දිය හැකි ය. රැස්කරගන්නා තොරතුරුවලින් ඔබ්බට පර්යේෂකයා වියුක්ත චින්තනය මෙහෙයවමින් සාමාන්‍යකරණයක් ගොඩනඟා ගැනීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම ද මෙහි ලක්ෂණයකි. එසේ ම පර්යේෂකයාට වැඩි කාලයක්, වෙහෙසක් දැරීමට සිදු වීම මෙන්න පර්යේෂකයාගේ පුද්ගල භාවය ද  දැඩි ලෙස බලපෑම මෙම ක්‍රමයේ දුබලතා ලෙස දැක්විය හැකි ය.

**සමාලෝචනය**

මේ අනුව පර්යේෂණ ක්‍රම අතරින් සන්ධාර විශ්ලේෂණය ක්‍රමය අධ්‍යාපන ක්ෂේත්‍රයේ බහුලව භාවිත කෙරෙන පර්යේෂණ ක්‍රමයක් වශයෙන් හඳුනාගත හැකි ය. දේශීය සංදර්භය තුළ පර්යේෂණ පිළිබඳ අවධානයේ යම් අඩුවක් පවතින බව පෙනේ. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ කලා උපාධිධාරීන් බහුල වශයෙන් සිදු කරනුයේ සන්ධාර විශ්ලේෂණ වේ. නමුත් ඒ පිළිබඳ අවබෝධය හා පර්යේෂකයන්ගේ අවධානය අවම මට්ටමක පවතී. යථෝක්ත විග්‍රහය මෙම ලිපිය ආධුණික පර්යේෂකයන් සඳහා මග පෙන්වීමක් වනු ඇත. මේ අනුව සන්ධාර විශ්ලේෂණ ක්‍රමය පර්යේෂණ ක්ෂේත්‍රයේ පර්යේෂකයන් බහුලව යොදාගන්නා පර්යේෂණ ක්‍රමයක් වශයෙන් දැක්විය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ආනනන්ද, සරත්. (2019). *සමාජීය විද්‍යා පර්යේෂණ හා විද්‍යාත්මක රචනය.* ෆාස්ට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්. කොළඹ 10.

උයන්ගොඩ, ජයදේව. (2014). *සමාජීය-මානවවිද්‍යා පර්යේෂණ,* දාර්ශනික හා ක්‍රමවේදී හැඳිනවීමක්. සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.කොළඹ 05

උයන්ගොඩ, ජයදේව. (2016). *සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම.* න්‍යයික හා ප්‍රායෝගික මඟපෙන්වීමක්. සමාජ විද්‍යාඥයන්ගේ සංගමය. කොළඹ 06.

කොඩිතුවක්කු, ගොඩ්වින්. (2014). *අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පරීක්ෂණ පර්යේෂණ.* කතෘ ප්‍රකාශන.

කොඩිතුවක්කු, ගොඩ්වින්. (2020). *පර්යේෂණ ක්‍රියාවලිය හඳුනාගනිමු.* පර්යේෂණ සහ සංවර්ධන ආයතනය. බත්තරමුල්ල.

ජයසූරිය, චන්ද්‍රා. (2000). *අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.* ශ්‍රී දේවි පුද්ගලික සමාගම. නැදිමාල.

ජයසේන, අශෝකා සහ සුසිලා කුමාරි අම්බැක්ක. (2015). *පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය.* ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ. (2016). *පර්යේෂන නිබන්ධ අත්පොත.* ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

රත්නපාල, නන්දසේන. (1995). *සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොල

ලේකම්ගේ, දයාලාතා. (2006). *අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ.* කර්තෘ ප්‍රකාශන,

*සම්භාෂා.* (2005). 13 කලාපය. වලස්වැවේ ඥානරතන හිමි. (සංස්කාරක). පිරිවෙන් අධ්‍යාපන ශාඛාව. අධ්‍යාපන අමාත්‍යාංශය. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

සිද්ධිසේන, කේ. ඒ. පී. (1997). *දත්ත විශ්ලේෂණ ප්‍රවේශය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

සිරිසුමන හිමි, හඳගිරියේ සහ මීනුවන්ගොඩ ඤාණාවාස හිමි. (2019). *පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රියාවලිය.* සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු වශ්වවිද්‍යාලය. අනුරාධපුර

සේනාධීර, සිල්වි සහ ශාමින්ද වනසිංහ. (2016). *පර්යේෂණ ක්‍රමවේදය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

හෙට්ටිආරච්චි, ශිරානි. (2020). *සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රම.* ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

Berelson B.L. (1952). *Content Analysis in Communications Research*. Free Press. New York.

Berg B.L. (2001). *Qualitative Research Methods for the Social Sciences*. Allyn and Bacon. Boston.

Creswell, J.W. (2006). *Research Design: Choosing among Five Approaches*. Thousand Oaks. CA: Sage

Lincoln, Y, S.., Guba, E.G. (1985). *Naturalistic Inquiry*. Sage Publications. Newbury Park. CA

Silverman D. (2001). Interpreting Qualitative Data Methods for Analyzing Talk, Text and Interaction. Sage Publications Inc. Thousand Oaks, California.

Denzin, N., Lincoln, Y. (2000). *The SAGE Handbook of Qualitative Research*. Grix, J. (2002). Introducing students to the generic terminology of social research Politics.

Guba, E. & Lincoln, Y. (2004). *Competing paradigms in qualitative research*. In Hesse-Biber, S. & Leavy, P. (Ed) Approaches to Qualitative Research.

Creswell, J. W. (2007). *Qualitative Inquiry and Research Design: Choosing among Five Approaches* (2nd Ed.). Thousand Oaks: Sage Publications.

Crotty, M. (1998). *The Foundations of Social Research: Meaning and Perspective in the Research Process*. London: SAGE.

Fraenkel, J. R., & Wallen, N. E. (2009). *How to Design and Evaluate Research in Education* (7th ed.). New York, NY: McGraw-Hill.

Grix, J. (2004). *The Foundations of Research. Hound mills: Palgrave Macmillan*. Guba, E. G. (1990). The paradigm dialog. Newbury Park, CA. London: Sage Publications.

Guba, E. G., & Lincoln, Y. S. (1994). *Competing paradigms in qualitative research*. In N. K. Denzin & Y. S. Lincoln (Eds.). Handbook of Qualitative Research. Thousand Oaks. CA: Sage.